ශ්‍රී ලංකා පොලිසියේ සංඛ්‍යාලේඛනයන්ට අනුව, 2019 වසර තුළ ශ්‍රී ලංකාවේ වාර්තා වී ඇති දිවි අහිමි කර ගැනීම් සංඛ්‍යාව 3,135 කි. එනම්, දිනකට දිවි අහිමි කරගැනීම් සාමාන්‍යය 8.5 කි. මෙනිසාම, දිවි අහිමි කරගැනීම් සම්බන්ධයෙන් වාර්තා කිරීමේදී මාධ්‍ය දැඩි ලෙසින් ඒ සම්බන්ධ මාධ්‍ය ආචාර ධර්මයන්ට අනුකූල වීම අපේක්ෂා කෙරේ.

දිවි අහිමි කරගැනීම් පිළිබඳ මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයන්ට නිදසුන් ලෙසින් පහත පුවත් වාර්තාවන් පෙන්වා දිය හැක. දිවි අහිමි කරගත් හෝ එසේ කිරීමට තැත් කර ආකාරය සඳහන් නොකරන ලෙසත්, එම ක්‍රියාව දීර්ඝ ලෙසින් විස්තර නොකරන ලෙසත් සඳහන් කෙරෙන්නේ, ඒ ඔස්සේ තවත් අය දිවි අහිමි කරගැනීමට පෙළඹීම හා ඒ ඔස්සේ දිවි අහිමි කරගැනීම් වසංගතයක් ලෙසින් පැතිර යෑමට ඉඩක් තිබීම නිසායි. එසේම දිවි අහිමි කරගැනීමට හේතු වූ කරුණු සරලව නොදක්වන ලෙසින් නිර්දේශ කෙරෙන්නේ, දිවි අහිමි කරගැනීමක් පසුපස කිසිසේත්ම සරල නොවූ සංකීර්ණ කරුණු කාරණා සමුදායක් තිබිය හැකි නිසායි. එසේම දිවි අහිමි කරගැනීම් සම්බන්ධ පුවත් වාර්තාවන් සමගින් උපකාරක අංක සඳහන් කරන මෙන් මාධ්‍යවේදීන්ව දිරිමත් කෙරෙන්නේ, ඒ ඔස්සේ දිවි අහිමි කරගැනීමට නැඹුරුතාවයක් ඇති තවත් අයෙකුගේ දිවි ගැලවීමේ හැකියාවක් ඇති බැවිනි.

දිවි අහිමි කරගැනීම් සම්බන්ධයෙන් ඔබගේ ආචාර ධාර්මික වාර්තාකරණය ඔස්සේ, තවත් ජීවිතයක් ගැලවීමට අවකාශ ඇති බව අවසන් වශයෙන් සටහන් කරමු.

මූලාශ්‍ර:
https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...

https://accountablejournalism.org/.../australia-standards...

හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ -0112696666
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926

**#MediaEthicsSL #lka #SinhalaPress #Aruna**